# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ලංසු ආරාධනය

## ස්ථාන 200ක් සඳහා දුම්රිය හරස් මාර්ග අධීක්ෂණ පද්ධති (LEVEL CROSSING MONITORING) සැපයීම, ස්ථාපනය සහ ක්‍රියාකරවීම සඳහා වන ප්‍රසම්පාදනය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය IFB No. - SRS/F. 8012**

1. ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයට **ස්ථාන 200ක් සඳහා දුම්රිය හරස් මාර්ග අධීක්ෂණ පද්ධති (LEVEL CROSSING MONITORING)** සැපයීම, ස්ථාපනය, පරීක්ෂාව සහ ක්‍රියාකරවීම සඳහා දේශීය නිෂ්පාදකයන් / සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

2 ලංසු කැඳවීම ජාතික **තරගකාරිත්ව ලංසු පටිපාටිය (NCB)** අනුව සිදු කෙරෙනු ඇත.

3 උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට **2024.06.20 සිට 2024.07.15** දක්වා සතියේ දිනවල වැඩ කරන දිනයන්හිදී **පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා** කාලය තුළ පහත දක්වා ඇති ලිපිනයෙන් **පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා** ලංසු ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි දුර තොරතුරු ලබා ගැනීමට හැකි ය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදනය),**
**දුම්රිය මාර්ගය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10,**
**ශ්‍රී ලංකාව.**
**දුරකථන අංක : + 94 (11) 2438078 හෝ + 94(11) 2436818**
**ෆැක්ස් අංකය : + 94(11) 2432044**
**ඊ මේල්: srs.slr@gmail.com**
**වෙබ් අඩවිය : www.railway.gov.lk**

4 ලංසු ඉදිරිපත් කරන දිනට ලංසුකරුට පහත සුදුසුකම් එකක් හෝ කිහිපයක් සපුරා තිබිය යුතු අතර ලංසුකරු විසින් ඉදිරිපත් කිරීම සමග ලේඛනමය සාක්ෂි (කාර්ය සාධන සහතික/මිලදී ගැනීමේ නියෝග පසුව සාක්ෂි සහිතව) ඉදිරිපත් කළ යුතුය.

අ. පසුගිය වසර 15 ක කාලය තුළ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත දුම්රිය හරස් මාර්ග ආරක්ෂක පද්ධතිය සපයා තිබීම.

ආ. ලංසුකරුවන් පසුගිය වසර 5 තුළ අවම වශයෙන් උද්ධෘත මිලට සමාන හෝ වැඩි අගයකට සමාන කොන්ත්‍රාත් අගයකට හෝ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත විදුලි/ඉලෙක්ට්‍රොනික පද්ධතිය (දුම්රිය සංඥා පද්ධති/ලොකෝ කළමනාකරණ පද්ධති සපයා තිබීම.

ඇ. ලංසුකරුට වසර 5කට වැඩි කාලයක් SCADA පද්ධති ස්ථාපනය කිරීමේ පළපුරුද්ද ඇති අතර පසුගිය වසර 5 තුළ උද්ධෘත මිලට නොඅඩු වටිනාකමක් සඳහා (ගැනුම්කරුගේ තෘප්තියට) ව්‍යාපෘතියක් සාර්ථකව සිදු කර තිබීම.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.06.20 සිට 2024.07.15 දක්වා** ප.ව.3.00 **තෙක් නැවත ගෙවනු නොලබන** රු.14,000/- ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා ලිඛිත අයදුම්පත්‍රයක් **ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය, ඕල්කොට් මාවත, කොළඹ** 10 යන ලිපිනයට යොමු කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය

6. පෙර ලංසු රැස්වීම **2024/07/02 දින පෙ.ව. 10.00ට** කොළඹ 09, ප්‍රධාන ඉංජිනේරු (සංඥා සහ විදුලි සංදේශ) කාර්යාලයේදී පැවැත්වේ.

7. **2024.07.16 ප.ව.2.00 හෝ එදිනට පෙර** පහත ලිපිනයට ලංසු එවිය යුතු අතර ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. මෙම ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කට් මාවත,**
**කොළඹ 10.**

2024.06.20
දිනමිණ